# නෝර්ත්සී ලිමිටඩ් (NSL)

## (ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පවතින සමාගමකි)

# පුරප්පාඩු

## 01. කර්මාන්ත සඳහා කළමනාකරු තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව : 03 තුනයි)

**පිහිටි ස්ථානය** : ලුණුවිල, වීරවිල සහ යාපනය

**වැටුප් පරිමාණය** : MM 1-1 2016 - II ශ්‍රේණිය. රු. 53,175 – 10X1375–15X1910– රු. 95,575/=

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විද්‍යාවේදී (BSc) ඉංජිනේරු (යාන්ත්‍රික) ක්ෂේත්‍රයේ උපාධියක් **සහ**

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු ලත් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් (01) වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

2. තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තියවේදී ඉංජිනේරු ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම හා තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක අවම වශයෙන් එම (01) වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**අභ්‍යන්තර අපේක්ෂකයින් : (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින්ට අදාළ හා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කනිෂ්ඨ කළමනාකරු වර්ගීකරණයේ (JM1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**පත්වීම්වල ස්වභාවය :**

ඉහත සඳහන් තනතුර ස්ථිර පදනම මත වනු ඇති අතර, වසර තුනක (03) ක පරිවාස කාලසීමාවකට යටත්ව EPF (සේවක අර්ථසාධක අරමුදල) හා ETF (සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල) ට හිමිකාරිත්වය දරනු ඇත.

**පොදු කොන්දේසි**

- අනර්ඝ හා විශිෂ්ඨ චරිත ස්වභාවයකින් යුත් සේවයට පැවරෙන රාජකාරි මැනවින් ඉටුකිරීමට සමත්, කායික හා මානසික යෝග්‍යතාවයෙන් හා නිරෝගීභාවයෙන් යුත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- රජයේ දෙපාර්තමේන්තු /රාජ්‍ය සංස්ථා/ව්‍යස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයින් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ පසුබිම සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවයක් දක්වනු ඇත. අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් සිය පූර්ණ ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) සහිතව ඥාතීන් නොවන නිර්දේශකයින් (02) දෙදෙනෙකුගේ නම් හා විමසුම් විස්තර ද ඇතුළත් අධ්‍යාපනික/ වෘත්තියවේදී සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රයද සහතික කළ පිටපත් හා පෙර පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමගින් 2021 මාර්තු මස 15 වන දිනට ඊට පෙර ලැබෙන සේ කොළඹ 10, D. R. විජේවර්ධන මාවතේ, අංක 450 හි නෝර්ත්සී ලිමිටඩ් හි සභාපති වෙත ලේඛනගත (ලියාපදිංචි කළ) තැපැලෙන් එවිය යුතු වන අතර, අයදුම්පත් එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**අයදුම් කරන තනතුර**" පැහැදිලිව සටහන් කළ යුතුය.

**සභාපති,**
**නෝර්ත්සී ලිමිටඩ් (NSL)**